# වචනයක් !

**අම්බලන්තොට වී පර්යේෂණ ස්ථානයේ**

**ඩබ්. ජී. පැන්ටිස් විසිනි**

1. අතහැර දමා ඔය කම්මැලි ගතිය සඳ
මගෙ රට මගේ ජාතිය යන හැඟුම පුදු
වැව්වොත් රටේ හැම බිම් අඟලක්ම මෙද
සැන සිය හැකිය අපටත් සැපසතුට බඳ

2. කන්නට අඳින්නට බොන්නට සිටින් නට
පුලුවන් රටක් වග පැහැදිලි කරන් නට
ගොවිතැන් වලින් ලැබූ දියුණුව කියන් නට
නංවමු අපිත් ජයහඬ පිට රටුන් හට

3. සවසාරවත් හොඳ සම්පත් වලින් පිරි
මගෙ මව් රටේ ඇත මුලු ලොව වනන සිරි
දිය ඇලි අගේ කොට එන කඳුවලින් පෙරී
ගොවිතැන් කරන්නට හෙළියිනි ! මොකද බැරි

4. හිඟමන් ලබන කවදත් පිට රැටියන් නෝ
කුස ගිනි නිවන්නට මෙ රටෙ මිනිසුන් නෝ
වැඩි අස්වනු ගෙනෙන නව වී නව පත්නෝ
නිපදන අයුරු අද ටික දෙනෙකුයි දන්නෝ

5. බැලුවොත් " අම්බලන්තොට " සහ " බතල ගොඩ "
පෙන්වයි " බොඹුවල " නව වී හදන වැඩ
ගන්නොරුව, ලබුදුව, කරපින්චකින් හැඩ
පැහැදිලි කරයි ගොවිකම ගැන නහන හඬ

6. පෝෂණ කරන්නට " සිරිලක් " නැමැති මල
වෙහෙසෙමු අපිත් ජාතික ගතියකින් බල
සව් සාරවත් මව් බිමකට ඇලුම කල
බිත්තර " වී " හොඳයි නිපදන " කඳුරු වෙල "

7. රට දූය සමය ගැන අදහස් සිතට නැග
කම්මැලි කම දුරැර එඩිතර ගතිය ලැග
සිහියට නගා මිනිසුන් දුක් විඳින වග
අප යා යුතුය " පැරකුම් " රජු ගියපු මග